## ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය - 2012

### 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2012 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයන් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම්

### 1.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඉකුත් වර්ෂයේදී පෙන්වා දෙන ලද පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු සමාලෝචිත වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.

(i) 2011 වර්ෂයේ ස්ථාවර වත්කම් වලට අදාළ ක්ෂයවීම් රු.41,567 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ii) 2011 වර්ෂයට අදාළ රු 534,826 ක් වූ වියදම් 2012 වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ආ) අවස්ථා 13 කදී වාහන අළුත්වැඩියා වෙනුවෙන් දරන ලද රු.522,254 ක් හා අවසථා 3 කදී පරිගණක අළුත්වැඩියා වෙනුවෙන් දරන ලද රු.68,621 ක්, පුනරාවර්තන වියදම් යටතේ ගිණුම්ගත කරනු වෙනුවට ප්‍රාග්ධන වියදම් යටතේ ගිණුම්ගත කර තිබුණි.

(ඇ) සමාජ ආරක්ෂණ අරමුදලෙන් ලබාගත් රු.2,830,000 ක ණය මුදල, ආදායම් වියදම් ගිණුමේ වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම් ගත කිරීම හේතුවෙන් වර්ෂයේ ඌණතාවය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් රු.10,305,796 ක් පාරිතෝෂිකය වෙන් කළයුතු වුවද, රු.9,701,275 ක් වෙන් කිරීම හේතුවෙන් පාරිතෝෂික වෙන්කිරීම රු.604,521 ක් අඩුවෙන් ගිණුම් ගත කර තිබුණි.

(ඉ) රජයේ ප්‍රාග්ධන ප්‍රදාන ගිණුම් ගත කිරීම සම්බන්ධයෙන් මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු ගිණුම්කරණ ප්‍රතිපත්තිය අනුව, ප්‍රාග්ධනිත වත්කමේ ප්‍රයෝජනවත් ජීවිත කාල පදනම් කරගෙන සමාලෝචිත වර්ෂයේ රජයේ ප්‍රාග්ධන ප්‍රදාන ආදායම් ප්‍රකාශයට ගැලපිය යුතු වුවත්, මණ්ඩලයට වාහනයක් මිලදී ගැනීමට දුන් රු.988,800 ක ප්‍රාග්ධන ප්‍රදානයෙන් රු.920,000 ක් වැය කර ඉතිරිය වූ රු.68,800 ක මුදල ආදායම් ප්‍රකාශයට ගලපා තිබුණි.

(ඊ) වාහනයක් විකිණීමේදී මණ්ඩලය ලබාගෙන තිබුණු රු.70,000 ක් වූ ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පතු මුදල්, ගෙවිය යුතු තැන්පතු ලෙස ගිණුම් ගත කරනු වෙනුවට ආදායමක් ලෙස ගිණුම් ගත කර තිබුණි.

(උ) මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ දක්වා තිබුණු පූර්ව වර්ෂය සඳහා ගැලපීම් වන රු.4,207,706 න් රු.17,273 ක් හඳුනා ගැනීමකින් තොරව මුදල් ප්‍රවාහ ප්‍රකාශයට ඇතුළත් කර තිබුණි.

(ඌ) ලිබඩු හා සවි කිරීම්වල ක්ෂය ගණනය කිරීමේදී, ශුද්ධ වටිනාකම ශූන්‍ය අගයක් ගෙන තිබුණු ස්ථාවර වත්කම් අයිතම 4 ක් සඳහා රු.22,759 ක් ක්ෂය කර තිබුණි.

(එ) සමාලෝචිත වර්ෂයේදී ස්ථාවර වත්කම් විකිණීමෙන් ලැබී තිබුණු රු.17,557 ක් ස්ථාවර වත්කම් විකිණීම් ගිණුමට බැර කර තිබුණද, එම වත්කම්වලට අදාල පිරිවැය සහ සමුච්චිත ක්ෂය ප්‍රමාණයන් ස්ථාවර වත්කම් විකිණීම් ගිණුමට මාරු කර නොතිබුණි.

(ඒ) සමාලෝචිත වර්ෂයේ ගෙවිය යුතු වියදම් රු.33,553,016 ක් වශයෙන් ගිණුම් ගත කර තිබුණද සත්‍ය උපචිත වියදම රු.33,603,608 ක් වුයෙන් උපචිත වියදම රු.50,592 ක් අඩුවෙන් ගිණුම්වල දක්වා තිබුණි.

(ඔ) 2010 හා 2011 වර්ෂවලට අදාළ විෂයයන් 32 ක එකතුව රු.612,408 ක් වූ වියදම් සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම් ගත කර තිබුණි.

(ඕ) සමාලෝචිත වර්ෂය සඳහා ආයෝජන පොලී ආදායම රු.161,092,187 ක් වුවද, එය රු.161,075,348 ක් ලෙස රු.16,839 ක් අඩුවෙන් ගිණුම් ගත කර තිබුණි.

(ක) 2010 දෙසැම්බර් 31 දින වන විට සම්පූර්ණයෙන්ම ක්ෂය කර අවසන් වී තිබුණ ස්ථාවර වත්කම් අයිතම 397 ක් ප්‍රත්‍යාගණනය කර එම වටිනාකම් පොත්වල සටහන් කිරීමට කටයුතු කර නොතිබුණි.

### 1.2.2 නොසැසඳුනු පාලන ගිණුම්

රජයේ බැංකු දෙකක 2012 දෙසැම්බර් 31 දිනට මුල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු ශේෂයන් සහ එම බැංකු පොත්වල සඳහන් ශේෂයන් අතර පිළිවෙලින් රු. 372,866 ක සහ රු.180,205 ක වෙනස්කම් පැවතුණි.

### 1.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්

2012 දෙසැම්බර් 31 දිනට විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට දායක මුදල් වශයෙන් දායකයින් විසින් රු.1,699,648,532 ක් ගෙවා තිබුණත් ඉන් ආයෝජන කර තිබුණේ රු.1,519,318,628 ක් පමණි. ඒ අනුව දායක මුදල් සහ ආයෝජන අතර රු.180,329,904 ක වෙනසක් පැවතුණි.

### 1.2.4 හඳුනා නොගත් ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ශේෂ පත්‍රයේ ජංගම වගකීම් යටතේ "මුදල් පොතේ ශේෂය" ලෙස දක්වා තිබුණු 2012 නොවැම්බර් මසට පෙර සිට හඳුනා නොගත් ලැබීම් රු.20,708,353 ක් හඳුනා ගෙන ගිණුම් ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2012 නොවැම්බර් මස සිට දෙසැම්බර් දක්වා මණ්ඩලයේ බැංකු ගිණුම්වලට සෘජුවම බැර වී තිබුණු මුදල් හඳුනා ගැනීමකින් තොරව, මුදල් පොතට හර කර දායක අරමුදලට බැර කිරීම හේතුවෙන් රජයේ බැංකු ගිණුම් තුනක එකතුව රු.16,551,654 ක් වූ හඳුනා නොගත් මුදල් ශේෂය ලෙස ගිණුම්වල අනාවරණය කර නොතිබුණි.

### 1.2.5 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

විගණනයේදී නිරීක්ෂණය වූ අනුකූල නොවීම් පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | මු.රෙ.104(3),(4) හා 109 | වාහනයකට සිදු වූ අනතුර සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාර කටයුතු කර නොතිබුණි. |
| (ආ) | මු.රෙ.371 (2) | මාණ්ඩලික නොවන නිලධාරීන් දෙදෙනෙකුට අවස්ථා දෙකකදී රු.20,000 ක් හා රු.10,000 ක් ලෙස අත්තිකාරම් ලබාදී තිබුණි. |

| | | |
|---|---|---|
| (ඇ) | මු.රෙ.371 (2) (ඇ) | 2004 වසරේ සිට පියවීම් නොකර පැවතෙන අත්තිකාරම් ශේෂය රු.6,900 ක් විය. |
| (ඈ) | මු.රෙ. 756 | 2012 දෙසැම්බර් 31 දිනට භාණ්ඩ සමීක්ෂණයක් කර නොතිබුණි. |
| (ඉ) | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | 2009 වර්ෂයෙන් පසු ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි. |
| (ඊ) | 2004 නොවැම්බර් මස 30 දිනැති අංක පීඊඩී 25 (3) දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | 2012 වර්ෂයේ ආයෝජන කර තිබුණු රු.1,519,318,628 ක් සඳහා මුදල් අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මණ්ඩලයේ වැඩ කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු.18,535,954 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.15,297,054 ක් විය. ඉකුත් වර්ෂය සමඟ සසඳන විට සමාලෝචිත වර්ෂයේ රු.3,238,900 ක පිරිහීම සඳහා ස්ථාවර වත්කම් ක්ෂයවීම රු. 8,292,612 කින් වැඩි වීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2012 වර්ෂයේ යෝජනා ක්‍රම සඳහා දිස්ත්‍රික් මට්ටමින් දායකයින් 50,000 ක් බඳවා ගැනීමට සැලසුම් කර තිබුණද, බඳවා ගෙන තිබුණේ දායකයින් 7,450 ක් පමණි. 2010 වර්ෂයේ 40,760 ක් ද, 2011 වර්ෂයේ 39,593 ක් ද, බඳවා ගෙන තිබුණු අතර එම වර්ෂ දෙක සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේදී දායකයින් බඳවා ගැනීමේ සීග්‍ර පිරිහීමක් වී තිබුණි.

(ආ) 2012 දෙසැම්බර් 31 දින වන විට සමාජ ආරක්ෂණ මණ්ඩලය විසින් විශ්‍රාම වැටුප් ක්‍රමයන්ට බඳවා ගෙන ඇති දායකයින්ගේ සංඛ්‍යාව 442,708 ක් වුවද, ඉන් දායකයින් 331,448 ක් අක්‍රිය තත්ත්වයට පත්වී තිබුණි. දායක මුදල් කාලීනව ගිණුම්ගත නොවීමද මෙලෙස දායකයින් අක්‍රිය වීමට බලපා තිබුණි.

(ඇ) දායකයින් බඳවා ගැනීම් ඉලක්ක සඳහන් කිරීමට අමතරව 2012 ක්‍රියාකාර සැලැස්ම මගින් පහත සඳහන් කාර්යයන් ඉටු කිරීමට සැලසුම් කර තිබුණද, ඒවා සාර්ථක කර ගැනීමට නොහැකි වී තිබුණි.

(i) විහව සමාජ ස්ථර හඳුනා ගැනීම යනුවෙන් දක්වා තිබුණද එම අරමුණ ඉටු කර ගැනීමට අනුගමනය කළ ක්‍රියාමාර්ග මොනවාද හා එහි ප්‍රතිඵල මොනවාද යන්න දක්වා නොතිබුණි. එමෙන්ම මෙමගින් මණ්ඩලය ලබාගැනීමට අපේක්ෂා කළ ප්‍රතිලාභය කමක්ද යන්න පැහැදිලි නොවුණි.

(ii) බඳවා ගැනීමේ ජාලය පුළුල් කිරීමට අදාලව කාර්යයන් ඉටු කළ බව දක්වා තිබුණද, 2012 වර්ෂයේ දායකයන් බඳවා ගැනීමේ සීඝ්‍ර පිරිහීමක් වී තිබුණි.

(iii) ආකර්ෂණීය හා ඵලදායි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණද නව යෝජනා ක්‍රම හඳුන්වා දෙනු වෙනුවට, 2006 සැප්තැම්බර් 25 දිනැති අංක 1464/5 දරන අති විශේෂ ගැසට් නිවේදනය මගින් හඳුන්වා දුන් සහන, තිළිණ, ඉසුරු, සරණ සහ ධන ලක්ෂ්මී යන යෝජනා ක්‍රම සඳහා දායකයින් බඳවා ගැනීම මණ්ඩලයේ චක්‍රලේඛ අංක SLSSB 2012/01 මගින් 2012 සැප්තැම්බර් 15 දින සිට නතර කර තිබුණි. එදින සිට අලුතින් බඳවා ගන්නා දායකයින්ව "සුරැකුම" යෝජනා ක්‍රමයට පමණක් බඳවා ගැනීම සිදුකර තිබුණි.

ස්වයං රැකියාවල නියුතු තැනැත්තන් සඳහා විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රම ඇති කර ඒවා කළමනාකරණය කිරීම අරමුණු කරගෙන 1996 අංක 17 දරන සමාජ ආරක්ෂණ මණ්ඩල පනත මගින් සමාජ ආරක්ෂණ මණ්ඩලය පිහිටුවූවද, දායකයින් සඳහා ක්‍රියාත්මක වු යෝජනා ක්‍රමයන්ද නතර කර "සුරැකුම" යෝජනා ක්‍රමය පමණක් ක්‍රියාත්මක කිරීම තුළින් ස්වයං රැකියාවල නියුතු තැනැත්තන්ට වැඩි ප්‍රතිලාභ අත්වන විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම කයාත්මක කිරීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණි.

(iv) 2012 වර්ෂයේ ක්‍රියාකාර සැලැස්මට අනුව වර්ෂයේ කළ යුතු ප්‍රධාන කාර්යයන් 12 ක් දක්වා තිබුණද, ඒවා ඉටු කර ගැනීමට කළ යුතු කාර්යයන් ඉලක්ක දිනයන් හා වගකිව යුතු නිලධාරීන් සඳහන් කරමින් විස්තරාත්මක ක්‍රියාකාර සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. එම හේතුව නිසා සැලසුම් කළ කාර්යයන් ඉටු නොවීමට වගකිවයුතු නිලධාරීන් හා සමාලෝචිත වර්ෂයේ සිදු වු අඩුපාඩු නිවැරදි කිරීමට ඉදිරි වර්ෂයේ ක්‍රියා කිරීම පිළිබඳව පසු විපරමක් කිරීමට මණ්ඩලයට නොහැකි වී තිබුණි.

## 3.2 මතභේදයට තුඩු දෙන ගනුදෙනු

1996 අංක 17 දරන සමාජ ආරක්ෂණ මණ්ඩල පනතේ IV වන කොටසෙහි 21 (2) (ආ) හා (ඇ) වගන්තිය ප්‍රකාරව, දායක මුදල් වශයෙන් මණ්ඩලයට ලැබෙන සියළුම මුදල්, ආයෝජන පොලී සහ ලාභ වශයෙන් උපයන සයළුම මුදල් මණ්ඩලයේ අරමුදලට බැර කළ යුතුය. මණ්ඩලය විසින් සමාජ ආරක්ෂණ දිරි දීමනා අරමුදලක් හා සමාජ ආරක්ෂණ සංවර්ධන අරමුදල නමින් අරමුදලක් පිහිටුවා දායක මුදල් එකතු කිරීම වෙනුවෙන් ගෙවනු ලබන දිරි දීමනා හා දායකයින් දැනුවත් කිරීම සඳහා දරනු ලබන වියදම් එම අරමුදල්වලින් වැය කර තිබුණි.

## 3.3 ආර්ථික නොවූ ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2012 මාර්තු මස විදුලි බිල නියමිත දිනට නොගෙවීම හේතුවෙන් රු.21,934 ක දඩ මුදලක් මණ්ඩලය විසින් ගෙවා තිබුණි.

(ආ) විශ්‍රාම වැටුප් අරමුදලින් රු.19,050,771 ක මුදලක් වැය කර නව පරිගණක පද්ධතිය ස්ථාපිත කර තිබුණද, ඒ සඳහා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන් අනුගමනය කර මිලදී ගැනීම සිදුකර නොතිබුණි. 2013 මාර්තු 22 දින වන විටද දායකයින්ගේ දායක මුදල් අය කිරීම හා ගිණුම්ගත කිරීම වර්ෂ ගණනාවක සට ප්‍රමාදව සිදුවන බැවින් පරිගණක පද්ධතිය ස්ථාපිත කිරීමෙන් බලාපොරොත්තු වූ අරමුණ ඉටුවී නොතිබුණි.

# 4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

## 4.1 සංයුක්ත සැලැස්ම

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.1 ජේදය පරිදි මණ්ඩලය විසින් 2012 සිට 2016 දක්වා සංයුක්ත සැලැස්මක් පිළියෙල කර තිබුණද, එම චක්‍රලේඛනයෙහි 5.1.2 ජේදයෙහි සඳහන් කරුණුවලට අනුව එය සකස් කර නොතිබුණි.

## 4.2 ක්‍රියාකාර සැලැස්ම

2012 වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු ක්‍රියාකාර සැලැස්ම, සංයුක්ත සැලැස්මේ සඳහන් අරමුණු ඉටු කර ගැනීමට හැකි වන ආකාරයෙන් කාර්යයන් කාලානුරූපීව බෙදා වෙන් කර එක් එක් කාර්යය සඳහා වගකිව යුතු නිලධාරීන් සඳහන් කරමින් ක්‍රමවත්ව පිළියෙල කර නොතිබුණ අතර සංයුක්ත සැලැස්මේ සඳහන් කාර්යයන් ඉටු කර ගත හැකි ආකාරයෙන් විස්තරාත්මකව එය පිළියෙල කර නොතිබුණි.

**4.3 ප්‍රසම්පාදන සැලැස්ම**

----------------------

2012 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර තිබුණද, එය සමාලෝචනය කර යාවත්කාලීන කර නොතිබුණ අතර එය පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

**5. පද්ධති හා පාලන**

-------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු ආයතනයේ සභාපතිවරයාගේ අවධානයට වරින් වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) වත්කම් පාලනය
(ආ) ගණුම්කරණය
(ඇ) අත්තිකාරම් පාලනය